**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.**

**<u>මහනුවර දිස්ත්‍රිකය</u>**

**1. මූල්‍ය ප්‍රකාශන.**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය.**

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

------------------------------------------

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

--------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදා ගෙන තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්.**

-----------------------------

රු.5,474,565 ක් වූ හිග හිටි වරිපනම් බදු ගිණුමේ ශේෂය එහි උපලේඛනයේ රු.6,177,015 ක හිග ශේෂය සමග සැසදීමේ දි, රු.702,450 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබියයුතු ගිණුම්.**

--------------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ දෙකක එකතු වටිනාකම රු.57,340,418 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මා තිබූ ශේෂයන්හි එකතුව රු.2,266,425 ක් වී තිබුණු අතර එම මුදලින් 2015 ජූනි 30 දිනට රු.750,547 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

**1.3.4 ගෙවියයුතු ගිණුම්.**

-----------------------

2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.67,686,049 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂ තුනක වටිනාකමින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ රු.917,925 ක ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.330,241 ක් තවදුරටත් ගෙවියයුතුව තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,178,488 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,344,286 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.17,834,202 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2014.01.01ට හිඟය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම | | 2014.01.01 ට හිඟ හිටි ශේෂයෙන් අය නොවූ ප්‍රමාණය | 2014 බිල්කළ ආදායමෙන් අය නොවූ ප්‍රමාණය | මුළු අය කලයුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | 2014.01.01 දිනට හිඟයෙන් එකතු කළ ආදායම | 2014 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| වරිපනම් හා බදු | 2,107,552 | 9,990,215 | 518,943 | 6,018,509 | 1,588,609 | 3,971,706 | 5,560 |
| බලපත්‍ර ගාස්තු | 126,461 | 1,565,162 | 55,050 | 1,403,117 | 71,411 | 162,045 | 233 |
| කසළ බද | 253,000 | 1,026,000 | 251,000 | 960,000 | 2,000 | 66,000 | 68 |
| කඩ කුලී | 40,050 | 32,400 | 17,150 | 16,000 | 22,900 | 10,400 | 39 |
| ජල ගාස්තු | 69,065 | 98,780 | 24,790 | 98,780 | 44,275 | - | 44 |
| උසාවි දඩ | 388,567 | 750,907 | 388,567 | 294,412 | --- | 456,495 | 456 |
| මුද්දර ගාස්තු | 16,701,372 | 29,979,901 | 11,232,404 | 7,321,864 | 5,468,968 | 22,658,037 | 28,127 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට රු.34,527,846 ක හිඟ හිට් ආදායමෙන් 2015 ජූනි 30 දින වන විට රු.34,522,653 ක් තවදුරටත් හිඟව පැවතුණි.

**2.2.2 හිග කඩ කුළී.**

**--------------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය වියයුතු හිග හිටි කඩ කුලී රු.39,300 ක් වූ අතර, එයින් කඩ කාමර 09 කින් මාස 09 සිට වර්ෂ 05 දක්වා කාල පරාසයකට අදාළ රු.35,650 ක කුලී පැවතුණි. එම කුලී අය කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

**2.2.3 දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවලට අදාළ ව්‍යාපාර බදු**

**------------------------------------------------------------**

දුරකථන සමාගම් 02 ක් මගින් සභා බල ප්‍රදේශය තුළ ඉදි කර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවලට අදාළ සමාලෝචිත වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තුව වූ රු.26,400 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 දැන්වීම් පුවරු ගාස්තු**

**------------------------**

අංක 1834 හා 2013 ඔක්තෝබර් 25 දිනැති හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ නිවේදනය අනුව ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා වර්ෂයකට වර්ග අඩියක් සඳහා රු.50 ක ගාස්තුවක් අය කළයුතු වුව ද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථානගත කර තිබුණු දැන්වීම් පුවරු 56 කින් රු.134,650 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.456,495 ක් හා මුද්දර ගාස්තු රු.28,127,005 ක් ලැබියයුතුව පැවතුණි. මෙම ශේෂයෙන් 2015 ජූනි 30 දින වන විටත් උසාවි දඩ රු.52,200 ක් හා මුද්දර
ගාස්තු රු.23,739,455 ක් තවදුරටත් ලැබියයුතුව පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**-----------------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**--------------------------------------**

සභාවට අයත් සුසාන භූමි 11 ක ඊට අදාළ මිණුම් කටයුතු සිදු කර මායිම් සකස් කොට වැටවල් ගැසීම සිදු කර වත්කම් ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් සුසාන භූමිවලට අදාළ ඉඩම් ආසන්න පදිංචිකරුවන් විසින් අත්පත් කර ගනිමින් පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

**3.2 අවිධිමත් ගනුදෙනු**

**------------------------**

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ තාර දමන ලද මාර්ග සම්බන්ධයෙන් නඩත්තු කටයුතු සිදු කර නොතිබිය දි, 2014 ඔක්තෝබර් 10 දින රු.518,750 ක් වටිනා තාර බැරල් 25 ක් සහ කෝලා බැරල් 05 ක් මිල දි ගෙන තිබුණි.

**3.3 නිශ්ක්‍රීය වත්කම්**

**------------------**

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු ගැල්වනයිස් බට 286 ක් කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව තබා තිබූ අතර, ජී.අයි. බට යොදා ගැනීමට අදාළ කිසිදු ව්‍යාපෘතියක් හඳුනා ගෙන ද නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**-----------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාන මාරු වී ගිය, වැඩ තහනමට ලක් වූ, විදේශගත වූ හා මිය ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.43,033 ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සභා බල ප්‍රදේශයේ අනවසර ඉදි කිරීම් 32 ක් හඳුනා ගෙන තිබුණ ද කඩා ඉවත් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අනවසර ඉදි කිරීම් නීත්‍යානුකූල කිරීමේ දී අය කළයුතු අනවසර ගාස්තු අය කිරීමට අදාළ ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි. නියැදි පරීක්ෂණයේ දී, ඉදි කිරීම් අවස්ථා 05 ක් සම්බන්ධව රු.221,500 ක දඩ මුදල් අය කර නොතිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය.**

**---------------------------**

**(අ) උඩුවාවල නැගෙනහිර රණවන සුහානි කඩේ අසළ සිට පොල්වත්ත පාරට වැටෙන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම - වැය කළ මුදල රු.980,000**

**-----------------------------------------------------------------------------------------------------**

(I) 1:2:4($^3$/4)" කොන්ක්‍රීට් මිශ්‍රණයේ අඟල් 05 ක ඝනකමින් මාර්ගය කොන්ක්‍රීට් කළයුතු වුවත්, මාර්ගය ආරම්භයේ සිට අඩි 162 ස්ථානයේ මාර්ගය මධ්‍යයෙන් කොන්ක්‍රීට් තට්ටුව කඩා පරීක්ෂා කිරීමේ දි එහි ඝනකම අඟල් 3 ක් බව අනාවරණය විය. තව ද, ප්‍රමිතිගත මිශ්‍රණය නොයෙදීම නිසා, ඉතා පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා මාර්ග තලය ඉදි කර තිබුණ බව ද, නිරීක්ෂණය වීම. මාර්ගයේ ස්ථාන 08 ක් පුපුරා ඉරි තලා ගොස් තිබුණ බව 2015 පෙබරවාරි 20 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී අනාවරණය වීම.

(II) ව්‍යාපෘතියට අදාළ නාම පුවරුව සඳහා රු.7,000 ක් ගෙවීම් කර තිබුණ ද නාම පුවරුව සවි කර නොතිබුණි.

**(ආ) බොකලවෙල පොදු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම - වැය කළ මුදල රු.660,332**

**-----------------------------------------------------------------------------------------**

(i) ඉදි කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක්, විධිමත් සැළසුම්, ඇස්තමේන්තු යනාදි කිසිවක් පිළියෙළ කිරීමකින් තොරව ඉදි කිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර, පාරිසරික බලපෑම් සම්බන්ධව කිසිදු අධ්‍යයනයක් ද සිදු කර නොතිබුණි.

(ii) ගිවිසුම් ප්‍රකාරව පස් පුරවා නිම කරන ලද කොටසට මායිම්ව විශාල ප්‍රමාණයක වගුරු බිමක් පැවතුණු අතර, එම භූමිය ක්‍රීඩා පිටියක් බවට පත් කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවත්, එම භූමියෙන් සියයට 05 ක පමණ කොටසක් මේ යටතේ නිම කර තිබුණි.

(iii) ගෙවීම් වාර්තාවට අනුව, ඝන මීටර් 1.36 ක් සඳහා රු.17,408 ක මුදලක් කාණු පද්ධතිය සකස් කිරීම වෙනුවෙන් ගෙවීම් කර තිබුණ ද, එය භාවිතයට ගත හැකි තත්ත්වයක නොපවතින බව

2015 පෙබරවාරි 20 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, දරන ලද වියදම නිෂ්ඵල වියදමක් බවට පත් වී තිබුණි.

**(ඇ) ටෙන්ඩර් පටිපාටි අනුගමනය නොකිරීම**

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව 177 හා 178 රීතිවල විධිවිධානවලට පටහැනිව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව සභා අරමුදලින් රු.5,310,000 ක් වටිනා කර්මාන්ත 53 ක ඉදි කිරීම් ප්‍රජා සමිතිවලට පවරා තිබුණි.

**3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.**

සභා බල ප්‍රදේශයේ දිනකට කසළ ටොන් 8 – 8 ½ ක් අතර ප්‍රමාණයක් එකතු වන අතර, කසළ එකතු කිරීම සඳහා වාහන 03 ක් යොදවා කසළ වර්ගීකරණයකින් තොරව සභාව සතු ඉඩමකට බැහැර කිරීම සිදු කරන බව නිරීක්ෂණය විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 ප්‍රසම්පාදන සැළැස්ම.**

සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැළැස්මක් ඉදිරිපත් කර නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය.**

සමාලෝචිත වර්ෂයේ සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.3 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 03 ක සියයට 34 සිට සියයට 83 දක්වා ද, වියදම් විෂයයන් 06 ක සියයට 17 සිට සියයට 50 ක් දක්වා ද, විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය සඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනය**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

(අ) ගිණුම්කරණය.
(ආ) අයවැය පාලනය.
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය.
(ඉ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය